# පැළැණ සිරි වජිරඤාණ දහම් පාසල - වැලිගම
# Pelena Siri Vajirañāna Dhamma School - Weligama

## ශ්‍රී බු. ව. 2566 - මධ්‍යවාර පරීක්ෂණය - 2022 දෙසැම්බර්
## 2566 B.E. - Mid Term Test - 2022 December
## 06 ශ්‍රේණිය - Grade - 06

**විභාග අංකය:-** ............................................................ **කාලය : පැය 02 යි.**

---

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න**

## I කොටස

01. සිංහල බෞද්ධ සහ සාහිත්‍යයේ උපදේශ කාව්‍ය අතර දීර්ඝතම උපදේශ කාව්‍ය කුමක් ද?

    i. ලෝවැඩ සඟරාව ii. ලෝකෝපකාරය iii. සුභාෂිතය

02. තෙවන ධර්ම සංගායනාව පවත්වන ලද්දේ බුද්ධ පරිනිර්වාණයෙන් කොපමණ කලකට පසුව ද?

    i. තෙමසක් ගතවූ විට ii. අවුරුදු සියයක් ගතවූ විට iii. මාසයක් ගත් වූ විට

03. මහා පැරකුම්බා රජතුමා විසින් ප්‍රතිසංස්කරණය කරන ලද කුඩා වැව් හා අමුණු ගණන කොපමණම ද?

    i. කුඩා වැව් 3910 හා අමුණු 165 යි. ii. කුඩා වැව් 2376 හා අමුණු 3910 යි.

    iii. කුඩා වැව් 2376 අමුණු 165 යි.

04. ආගමික පුනරුදය මගින් සදාචාර දියුණුවට මග පෑදූ රජතුමා කවුරුන් ද?

    i. මහපැරකුම්බා රජතුමා ii. දුටුගැමුණු රජතුමා iii. මහා විජයබාහු රජතුමා

05. දෙමව්පියන්ට නියම ලෙස ප්‍රත්‍යුපකාර කිරීමට නම් දරුවන් ඒ අය ගුණාංග හතරක පිහිටවිය යුතුය. පළමු ගුණාංගය කුමක්ද?

    i. සීල චාග ii. සද්ධා iii. පඤ්ඤා

06. ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කර කරවීමේ දී එහි ආරක්ෂාව සඳහාත් එය පුද පූජා හා තේවා විධි පැවැත්වීම සඳහාත් මෙරටට එවූ පිරිසෙයින් අයත් ශ්‍රේණි ගණන කොපමණ ද?

    i. ශ්‍රේණි 18 ය. ii. ශ්‍රේණි 12 ය. iii. ශ්‍රේණි 10 ය.

07. කුලතුංග බණ්ඩාර පැවිදි දිවියට ඇතුළත් වූ නාමය කුමක් ද?

    i. වැලිවිට සරණංකර හිමි ii. ඤාණවිමල තිස්ස හිමි iii. එස් මහින්ද හිමි

08. අමරපුර නිකාය පිහිටුවා වදාළ නාහිමිපාණන් වහන්සේ කවුරුන් ද?

i. ඉන්දාසභවරඤාණසාමි මාහිමි ii. වැලිවිට සරණංකර හිමි
iii. ඤාණවිමලතිස්ස හිමි

09. නුවර පෙරහැර ආරම්භ වුයේ කුමන දෙවිවරුන් මුල් කරගෙන ද?

i. නාථ දේවාලය ii. විෂ්ණු දේවාලය
iii. නාථ විෂ්ණු, කතරගම, පත්තිනි සිව් දේවාලය

10. නුවර පෙරහැර අවසන් වන්නේ කුමන උත්සවයකින් පසුව ද?

i. දිය කැපීමේ උත්සවය ii. කප් සිටුවීමේ මංගල්‍යය iii. ආමිස පූජාව

11. අමදින ලද මළුවේ වැලි දෝතක් අහසට විසිකර ඒ තරමටම අවවාද අනුශාසනා ලැබේවායි ප්‍රාර්ථනා කළේ,

i. සුද්ධෝදන රජු ii. රාහුල හිමි iii. බුදුරජාණන් වහන්සේ

12. ඡන්ද යනු,

i. හිතවත්කම් ii. භය iii. කැමැත්ත

13. අතීත රජ නාමාවලියේ එන බුද්ධදාස රජතුමා සුප්‍රසිද්ධ වූයේ

i. වෛද්‍ය වරයෙකු ලෙස ii. සූපවේදියකු ලෙස iii.ගුරුවරයෙකු ලෙස

14. ධර්මාශෝක රජ කාලය වන විට බිහිවී තිබූ නිකාය ගණන කීයද?

i. නිකාය 5 කි නිකාය ii. 18 කි iii. නිකාය 20 කි

15. දසවස්තුව කැප යැයි පිළිගත් පිරිස සංගායනාව සිදු කලේ කොහේදී ද?

i. විශාලාමහනුවර ii. දඹදිව iii. කොසඹෑ නුවර

16. විනයධර භික්ෂූන් අතර අග්‍ර තනතුර දැරූ භික්ෂුව කවුරුන්ද?

i. උපාලි තෙරුන් ii. රාහුල තෙරුන් iii. ආනන්ද තෙරුන්

17. ප්‍රථම ධර්ම සංගායනාවට සහභාගී වූ රහතන් වහන්සේලා ගණන කීයද?

i. 500 නමකි ii. 25 නමකි iii. 200 නමකි

18. රාජකීය වප්මඟුල් දිනයේ දී සිදුහත් කුමරු වැඩූ භාවනාව කුමක් ද?

i. සමථ භාවනාව ii. විදර්ශනා භාවනාව iii. ආනාපානසති භාවනාව

19. මහිංසාසක සහ ඡන්ද කුමාරවරුන්ගේ පියාණන් කවුරුන්ද?

i. බ්‍රහ්මදත්ත රජු ii. කාලාශෝක රජු iii. ධර්මාශෝක රජු

20. මහා විජයබාහු රජු රජකම් කළ රාජ්‍ය කුමක්ද?

i. පොලොන්නරුව රාජධානිය. ii. මහනුවර රාජධානිය.

iii. යාපහුව රාජධානිය.

**(ලකුණු 40 යි)**

## II කොටස

01.

i. මල්, පලතුරු, ඖසු වගාවන් සිදු කිරීමෙන් අපට නිරාමිස සුවයක් ඇති කරගත හැකිය. එහි ප්‍රයෝජන 5ක් ලියා දක්වන්න.

ii. වැසිකිලි භාවිතයේදී පිරිසිදුකමට අදාලම බුදු දහමේ සඳහන් වන සිරිත් 05ක් ලියා දක්වන්න.

iii. කායේන වාචා චිත්තේන.... යන ගාථාව සම්පූර්ණ කර එහි තේරුම් ලියා දක්වන්න.

**(ලකුණු 15 යි)**

02.

i. මෛත්‍රිය වැඩීමේ ආනිසංස ඇතුලත් සූත්‍රය කුමක් ද?

ii. එහි සඳහන් ආනිසංස පහක් ලියා දක්වන්න

iii. උට්ඨානවතෝ සතිමතෝ.... ගාථාවව සම්පූර්ණ කරන්න.

**(ලකුණු 40 යි)**

03.

i. වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ මා හිමි පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

ii. චතුරාර්‍ය සත්‍ය නම් කරන්න.

iii. ශ්‍රී මහා බෝධීන් වහන්සේ උදෙසා වාර්ෂිකව සිදු කරනු ලබන මංගල්‍ය මොනවා ද?

**(ලකුණු 40 යි)**

04.

i.ගුරුදෙගුරුන් හට ඔබට කළ හැකි ප්‍රත්‍යුපකාර 5ක් ලියා දක්වන්න.

ii. යෝච පුබ්බේ පමජ්ජිත්වා... ගාථාව සම්පූර්ණ කරන්න.

iii. එක් පුද්ගලයෙකු පිළිබඳ විස්තර කරන්න.

- මහා විජයබාහු රජතුමා
- මහා පැරකුම්බා රජතුමා

**(ලකුණු 40 යි)**